# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1902/44 - 2015 පෙබරවාරි මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2015.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* මහ/ඉ/අත්/332.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩහමුල්ල ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක කො 9479හි පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.1359ක් පමණ වූ විස්තර කෙරෙන ඉඩම:

**1. කැබලි අංක 01**

ඉඩමේ නම: දෙල්ගහවත්ත (තලපත්පිටිය පාරේ වරිපනම් අංක 87/3 දරන ඉඩම); ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක්, ස්ථිර ළිඳක්, වැසිකිළි වළක්, අවුරුදු 20ක් පමණ වන කොස් ගසක් සහ අඹ ගසක්, අවුරුදු 12ක් පමණ වන වෙරළු ගසක් සහ අවුරුදු 08ක් පමණ වන ඇඹරැල්ලා ගසක් ඇත; හිමිකම් කියන අය: එස්. එම්. කේ. රණසිංහ , අංක 45/3, චන්ද්‍රාලෝක මාවත, කනත්ත පාර, උඩහමුල්ල, නුගේගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0229.

**2. කැබලි අංක 02**

ඉඩමේ නම: දෙල්ගහවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක්, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක්, අවුරුදු 14ක් පමණ වන තැඹිලි ගසක් සහ අවුරුදු 20ක් පමණ වන පොල් ගසක් ඇත; හිමිකම් කියන අය: කමලා  පියසීලි, අංක 241, පරණ පාර, මුල්ලේරියාව උතුර, අංගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0191.

**3. කැබලි අංක 03**

ඉඩමේ නම: දෙල්ගහවත්ත (තලපත්පිටිය පාරේ වරිපනම් අංක 87 දරන ඉඩම); ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ ස්ථිර ළිඳක් ඇත; හිමිකම් කියන අය: පී. ඩබ්. ඒ. ඩී. ග්‍රේස් ලින්, අංක 87, තලපත්පිටිය පාර, උඩහමුල්ල, නුගේගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0220.

**4. කැබලි අංක 04**

ඉඩමේ නම: දෙල්ගහවත්ත; ඉඩම් පරිහරණය: ප්‍රවේශ මාර්ගය; හිමිකම් කියන අය: එස්. එම්. කේ. රණසිංහ , අංක 45/3, චන්ද්‍රාලෝක මාවත, කනත්ත පාර, උඩහමුල්ල, නුගේගොඩ, සේනාධීරගේ දොන් රංජිත් 87/2, තලපත්පිටිය පාර, උඩහමුල්ල, නුගේගොඩ, කමලා පියසීලි, අංක 241, පරණ පාර, මුල්ලේරියාව උතුර, අංගොඩ සහ දීපිකා වික්‍රමතුංග, කරන්කැටිය, රක්වාන; ප්‍රමාණය: හෙක්. 0.0111.

**5. කැබලි අංක 05**

ඉඩමේ නම: දෙල්ගහවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ළිඳක් සහ අවුරුදු 15ක් පමණ වන දෙල් ගසක් ඇත; හිමිකම් කියන අය: නාමලී සේනාධීර, ලිපිනය සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0207.

**6. කැබලි අංක 06**

ඉඩමේ නම: දෙල්ගහවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, වැසිකිළි වළක්, වැසිකිළි වළක කොටසක් සහ අවුරුදු 15ක් පමණ වන දෙල් ගසක් ඇත; හිමිකම් කියන අය: දීපිකා වික්‍රමතුංග, කරන්කැටිය, රක්වාන; ප්‍රමාණය: හෙක්. 0.0186.

7. **කැබලි අංක 07**

ඉඩමේ නම: දෙල්ගහවත්ත (තලපත්පිටිය පාරේ වරිපනම් අංක 87/2 දරන ඉඩම); ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක්, තාවකාලික ගොඩනැගිල්ලක්, වැසිකිළි වළක කොටසක්, අවුරුදු 14ක් පමණ වන තැඹිලි ගසක් සහ අවුරුදු 12ක් පමණ වන සියඹලා ගසක් ඇත; හිමිකම් කියන අය: සේනාධීරගේ දොන් රංජිත්, 87/2, තලපත්පිටිය පාර, උඩහමුල්ල, නුගේගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0215.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2015 මාර්තු මස 11 වැනි දින පෙ. ව. 9.00ට මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2015 මාර්තු 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ, විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු සහ ඒවායේ උධෘත සහ අනෙකුත් ලියවිලි පරීක්ෂණයේ දී මා වෙත ඉදිරිපත් කළ යුතු යි.

බුද්ධි තරංගා කරුණාසේන,
ප්‍රාදේශීය ලේකම්,
මහරගම.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මහරගම.

03-131

---

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: ව/18/56/2001/II.

වර්ෂ 2009ක් වූ නොවැම්බර් මස 23 වැනි දින අංක 1629/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද දැන්වීමේ සඳහන් මූලික පිඹුරු අංකය ගම් 3718 දරන පිඹුරේ කැබලි අංක 96 කැබලි අංක 178 සහ 179 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දී සිටිමි.

**කැබලි අංක 178**

ඉඩමේ නම: ගොරකගහවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජේ. ඒ. ප්‍රියංකා, අංක 128/1, තපෝවනරාම පාර, මත්තුමගල, රාගම: ප්‍රමාණය; හෙක්. 0.0005.

**කැබලි අංක 179**

ඉඩමේ නම: ගොරකගහවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලකින් කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: හෙට්ටිආරච්චිගේ කුසුමාවතී, අංක 128/1, තපෝවනරාම පාර, මත්තුමගල, රාගම: ප්‍රමාණය; හෙක්. 0.0009.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ කැබලි අංක 178-179 දක්වා 2015 මාර්තු මස 18 වැනි දින පෙ. ව. 10.00ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2015 මාර්තු මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ, විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය .

ඩබ්ලිව්. ජී. ප්‍රේමලාල්,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2015 පෙබරවාරි මස 16 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 132

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.